සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.08/ 0830 - 1030

| | | |
|---|---|---|
| **නැටුම් (භරත) I**<br>நாட்டியம் (பரதம்) I<br>Dancing (Baratha) I | **53 S I** | **පැය දෙකයි**<br>இரண்டு மணித்தியாலம்<br>*Two hours* |

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* පිළිතුරු පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය, **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

**1.** සිවන් ඓංතොලිල් කිරීමට ආනන්ද තාණ්ඩවම් නටන පුණ්‍ය ස්ථානය කුමක් ද?
(1) තිරුවණ්ණාමලෛ (2) සිදම්බරම් (3) තිරුවාලෛණක්කා
(4) තිරුවීළිමිළලෛ (5) තිරුවලංචුළි

**2.** සංගීත සංදර්ශනවලදී ද, නාට්‍ය සංදර්ශනවලදී ද අවසානයේ යෙදෙන උරුප්පඩිය වන්නේ,
(1) වර්ණම් ය. (2) පදම් ය. (3) කීර්තණම් ය.
(4) ජාවලී ය. (5) තිල්ලානා ය.

**3.** යාපනයේ නැටුම් පාසල ආරම්භ කරනු ලැබුවේ,
(1) සර් පොන්. රාමනාදන් මහතා ය. (2) පරම් තිල්ලෛරාජා මහතා ය.
(3) වී. ආර්. රාසනායගම් මහතා ය. (4) සු. නඩේසපිල්ලෛ මහතා ය.
(5) සී. වයි. තාමෝදරම් පිල්ලෛයි මහතා ය.

**4.** 'අභිනයදර්පණම්' යන ග්‍රන්ථය දෙමළ බසට පරිවර්තනය කළ පුද්ගලයින් වන්නේ,
(1) උ. වේ. සාමිනාදෛයර් හා වීරරාගවන් ය.
(2) ආනන්ද කුමාරස්වාමි හා නන්දිකේෂ්වරර් ය.
(3) ශ්‍රීරාමතේසිගන් හා වීරරාගවන් ය.
(4) ආනන්ද කුමාරස්වාමි හා උ. වේ. ස්වාමිනාදෛයර් ය.
(5) නන්දිකේෂ්වරර් හා ශ්‍රීරාමතේසිගන් ය.

**5.** 'තිශ්‍රජාති තුරුවතාලම්' 'මිශ්‍ර කඩි' වන විට ගන්නා ගණන
(1) 72 වේ. (2) 77 වේ. (3) 90 වේ. (4) 96 වේ. (5) 99 වේ.

**6.** උඩරට නැටුමෙහි දක්නට ලැබෙන වන්නම්වල ඉදිබුවෙකු විසින් සිංහයෙකු රවටා ළිඳකට තල්ලු කිරීම පිළිබඳ කියවෙන වන්නම වනුයේ,
(1) ගජගා වන්නම ය. (2) මයුරා වන්නම ය. (3) කිරළා වන්නම ය.
(4) ගණපති වන්නම ය. (5) සිංහරාජ වන්නම ය.

**7.** 'පුලින තලාව' හා සබැඳි නර්තන වර්ගය කුමක් ද?
(1) ආයිච්චියර් කුරවෛ (2) කුන්ට්‍රක් කුරවෛ (3) වේට්ටුව වරි
(4) වෙරියාඩල් (5) තුණංගෛක් කුත්තු

**8.** "එන්ණෙන් කලෛයුම් ඉසෛන්දුඩන් පෝහ...." යන ගීත ඛණ්ඩය මගින් කලා හැටහතරක් පිළිබඳ කියැවෙන ග්‍රන්ථය වනුයේ,
(1) කාම සූත්‍රය ය. (2) සිලප්පදිකාරම් ය. (3) තොල්කාප්පියම් ය.
(4) නාට්‍ය ශාස්ත්‍රය ය. (5) සරස්වතී අන්දාදි ය.

[ දෙවැනි පිටුව බලන්න.

**9.** සිවදෙවියන්ගේ කරණං, මූර්තිවලින් ප්‍රථම වරට සකස් කරන ලද දේවාලය වනුයේ,
(1) මදුරෛ මීනාච්චි අම්මන් දේවාලය ය.
(2) පිරකදීෂ්වරර් දේවාලය ය.
(3) කුම්බකෝණම් සාරංගපාණි දේවාලය ය.
(4) ගංගෛ කොණ්ඩ සෝල්පුර දේවාලය ය.
(5) සිදම්බර නඩරාජර් දේවාලය ය.

**10.** ලංකාවේ නාට්‍ය කලාවේ පුරෝගාමියා වන ඒරම්බු සුප්පයියා මහතා විසින් ගොඩනගන ලද නාට්‍ය රංග ශාලාව වනුයේ,
(1) කලාභවනම් ය. (2) කලෛක්කෝවිල් ය. (3) කලා මන්දිර් ය.
(4) කලාලයම් ය. (5) නාට්‍ය ශේත්‍රා ය.

**11.** නාට්‍ය ශාස්ත්‍රය තෙළිඟු භාෂාවෙන් පරිවර්තනය කිරීමට දායක වූ සංස්කෘත පඬිවරයා වන්නේ,
(1) එස්. එන්. ශ්‍රීරාමතේසිගන් ය. (2) නන්දිකේශ්වරර් ය.
(3) මනෝ මෝගන් කෝෂ් ය. (4) මානවල්ලි රාමක්‍රිෂ්ණ කවි ය.
(5) වීරරාගවෛයර් ය.

**12.** මෛයිත්ති, ජසෝයි, රාස යන චාරිත්‍ර ඇතුළත් ශාස්ත්‍රීය නර්තනය වනුයේ
(1) කතකලි ය. (2) කුච්චුප්පුඩි ය. (3) මණිප්පුරි ය.
(4) භරත නාට්ටියම් ය. (5) ඔඩිසි ය.

**13.** අෂ්මියුද හශ්තංවලින් නම සඳහන් සුළං වාද්‍ය භාණ්ඩය කුමක් ද?
(1) බටනළාව (2) නාදශ්වරම් නළාව
(3) මුඛවීනෛ (මුඛ නළාව) (4) සර්පිනාව
(5) හක්ගෙඩිය

**14.** සිංහල කලා සම්ප්‍රදායවල අතීත කාල ග්‍රාමීය කලා නිර්මාණයක් වන සොකරියේ, සොකරි යනු
(1) ප්‍රධාන පාත්‍ර වර්ගයා ය. (2) වේදිකාව ය. (3) අංග රචනය ය.
(4) තාල භාණ්ඩය ය. (5) ඇඳුම ය.

**15.** දෙමළ පදම් නිර්මාණය කරන්නවුන් අතුරෙන් ජ්‍යෙෂ්ඨ පුරෝගාමියකු ලෙස ද කටයුතු කළ රචකයා වන්නේ,
(1) කවිකුංචර භාරදි ය. (2) කනම් ක්‍රිෂ්නෛයර් ය.
(3) මළවෛ සිදම්බර භාරදියාර් ය. (4) සීර්කාලි මුත්තු තාණ්ඩවර් ය.
(5) ඌත්තුක්කාඩු වේංකඩ සුප්පෛයර් ය.

**16.** පළමු මණ්ඩි අඩව්ව එක්වරක් අභිනය කරන සේ සකස් කරන ලද පාද භේදය
(1) ආලිඩම් ය. (2) මෝඩිදම් ය.
(3) සමසූසි ය. (4) ශ්වශ්තිකම් ය.
(5) ප්‍රත්‍යාලීඩම් ය.

**17.** රාමනාදන් ලලිත කලායතනයේ නැටුම් අංශයේ පළමුවැනි සභාපති ලෙස 1996 දී පදවි ප්‍රාප්තිය ලබා ගත්තේ,
(1) මහාචාර්ය අ. ෂන්මුගදාස් ය.
(2) මහාචාර්ය කා. සිවත්තම්බි ය.
(3) මහාචාර්ය පො. බාලසුන්දරම් පිල්ලෛ ය.
(4) ආචාර්ය ක්‍රිෂාන්ති රවීන්ද්‍රා ය.
(5) මහාචාර්ය සබා ජෙයරාජා ය.

**18.** තකදිමි තකදිමි තකදිමි තක තදිං /, කිණ දොම් තදිං, කි/ණ දොම් තදිං, කි ණ දොම්//
මෙහි සඳහන් කර ඇති 'තදිංකිණ දොම්' හි ජාති වනුයේ,
(1) තිස්රම් ය. (2) සතුෂ්රම් ය. (3) කණ්ඩම් ය. (4) මිශ්‍රම් ය. (5) සංකීර්ණම් ය.

**19.** ඔඩිසි නැටුමෙහි ආරම්භයේ අභිනන්දනයට පාත්‍ර වන දෙවියන් වනුයේ,
(1) කාර්තිකේයන් ය. (2) අකිලාණ්ඩේශ්වරි ය. (3) ජෙගන්නාදර් ය.
(4) මීනලෝජනි ය. (5) ජෙංගරන් ය.

**20.** පදවර්ණයේ තීර්මාණම් අවසන් වූ පසු ආරම්භ වන්නේ,
(1) කෝර්වෙ ය. (2) ජති ය. (3) තාලම් ය.
(4) අඩව් ය. (5) අරුදි ය.

**21.** ආත්මාස්ත, පරාස්ත යන කොටස් දෙකෙහි රසම් වනුයේ,
(1) ශෘංගාරම් ය. (2) බීපත්සම් ය. (3) භයානකම් ය.
(4) හාස්‍යම් ය. (5) රෞද්‍රම් ය.

**22.** කතකලි නැටුම් පිළිබඳව විවරණය කෙරෙන ග්‍රන්ථය වනුයේ,
(1) හස්ත මුද්‍රාවලි ය. (2) හස්ත ලක්ෂණදීපිකා ය.
(3) අභිනය සාරසම්පුඩම් ය. (4) අභිනය නවනීදම් ය.
(5) අභිනයදර්පණම් ය.

**23.** "නාහම් පුයත්තිට්‍රි කට්ටි නංජු කළුත්තිට්‍රි කට්ටි ......." යන ගීතයේ සඳහන් අය වන්නේ,
(1) සිවන් ය. (2) මුරුගන් ය. (3) විෂ්ණු ය.
(4) මන්මදන් ය. (අනංගයා) (5) ඉන්ද්‍රන් ය.

**24.** 'තිරුමහල්' නර්තනය කළ කුත්තු වනුයේ,
(1) අල්ලියම් ය. (2) මල්ලාඩල් ය. (3) පාවෛ ය.
(4) තුඩි ය. (5) පේඩි ය.

**25.** මේලකර්තා හැත්තෑ දෙක චක්‍රවල හින්දු හා රිෂි නමැති චක්‍රයන්හි ප්‍රථම රාග පිළිවෙළින් වනුයේ,
(1) ගායගප්ප්‍රියා හා තවලම්පරි ය. (2) මාරරංජනි හා කාන්තාමණි ය.
(3) හනුමතෝඩි හා කවාම්පෝදි ය. (4) යාහප්ප්‍රියා හා සුසරිත්ත්‍රා ය.
(5) කණකාංගී හා ශාලකම් ය.

**26.** නළවෙන්පාවල ඇති "නාට්කුණමුම් නාට්පඩෛයායි...." නමැති ගීතයේ සඳහන් වන සිව්ආකාර ගුණ වනුයේ,
(1) වීරත්වය, භය, තරහව, ඇඬීම (2) විශ්මය, හාස්‍ය, කරුණාව, ශාන්තිය
(3) පිළිකුල, පුදුමය, කෝපය, ශාන්තිය (4) භය, මෝඩකම, ලැජ්ජාව, පිළිකුල
(5) ප්‍රමාදය, තේජස, ශක්තිය, මෛත්‍රිය

**27.** ලංකාවේ ක්‍රියාත්මක වන වඩමෝඩි, තෙන්මෝඩි හා වසන්දන් කුත්තු යන ඒවායේ අනන්‍යය භාණ්ඩය වනුයේ,
(1) මිරුදංගම් ය. (2) මද්දලය ය. (3) දවුල ය. (4) තබ්ලාව ය. (5) තප්පුව ය.

**28.** "ඔලි සෙයිදාන් කදිර්කෝමාන්....." යන ගීතයේ කදිර්කෝමාන් යන්න අභිනය කරන්නට උපකාරී වන දකුණු අතෙහි හා වම් අතෙහි මුද්‍රා වනුයේ පිළිවෙළින්
(1) කපිත්තම් හා අලපද්මම් ය. (2) පදාකම් හා අලපද්මම් ය.
(3) සූසි හා තාම්රසූඩම් ය. (4) කපිත්තම් හා කපිත්තම් ය.
(5) කඩගාමුගම් හා සිගරම් ය.

**29.** "වඩ ඉලංගෛ නාට්ටාර් අරංගු" යන කෘතියේ කතෘ වූයේ,
(1) මහාචාර්ය කා. සිවතම්බි ය. (2) මහාචාර්ය වී. සිවසාමි ය.
(3) මහාචාර්ය ක. කනපතිපිල්ලෛ ය. (4) ආචාර්ය කාරෛ සෙ. සුන්දරම්පිල්ලෛ ය.
(5) මහාචාර්ය සූ. විත්තියානන්දන් ය.

**30.** "කන්නකු තිරල්පුයක් කණවන්....." යන කම්බරාමායන ගීතයේ 'අන්නමුම් තුයරක් කඩල් අඩි වෛත්තාල් අරෝ' යන කොටස අභිනය කරන විට ඇති වන ස්ථායි නිරූපණය (ස්ථායි භාවම්) වනුයේ,
(1) රතියයි. (2) ක්‍රෝධයයි. (3) ශෝකයයි.
(4) භයයි. (5) විශ්මයයි.

**31.** 'කුච්චුප්පුඩි' නැටුමෙහි අධික ලෙස ප්‍රශස්තියට ලක් කරන නැටුම වනුයේ,
(1) රාශලීලා ය. (2) රාමණාට්ටම් ය. (3) ටුක්වාල් ය.
(4) පුං සෝලම් ය. (5) බාමා කලාපම් ය.

**32.** 'තණ්ණුමෙ' යනුවෙන් හඳුන්වන වාද්‍ය භාණ්ඩය වනුයේ,
(1) දවුලයි. (2) තබ්ලාවයි. (3) උඩැක්කියයි.
(4) මිරුදංගයයි. (5) මද්දලයයි.

**33.** ත්‍රිපතාක දෙඅත් භාවිත කර අභිනය මගින් "මනිදරුම් දේවරුම් මායා මුනිවරුම් වන්දු" යන අභිරාමි අන්දාදි ගීතයෙහි අර්ථය ප්‍රකාශ වන පදය වනුයේ,
(1) මිනිසා ය. (2) දේවර් ය. (3) ඍෂිවරයා ය.
(4) අභිරාමි ය. (5) සිවන් ය.

**34.** අෂ්ඨපදියේ ප්‍රකාශ වන භාවම් වනුයේ,
(1) හාශ්‍ය භාවම් ය. (2) සාක්කිය භාවම් ය.
(3) වාත්සල්‍ය භාවම් ය. (4) කාන්ද භාවම් ය.
(5) මධුර භාවම් ය.

**35.** "වාරණම් ආයිරම් සූල වලම් සෙයිදු......" යන ගීතයේ තම විවාහය සිදු වීමට සිහින දකින කථානායිකාව වනුයේ,
(1) ආණ්ඩාල් ය. (2) මීරා ය. (3) පද්මාවතී ය.
(4) වසන්තවල්ලී ය. (5) දේවගී ය.

**36.** ප්‍රථමයෙන්ම සංගීත ආචාර්ය උපාධි ලබාගත් කලාකරුවා වන්නේ,
(1) රුක්මණි අරුන්ඩේල් මහත්මිය ය. (2) බාලසරස්වතී මහත්මිය ය.
(3) වලුවූර් රාමයියාපිල්ලෙ මහතා ය. (4) ගෞරි අම්මාල් මහත්මිය ය.
(5) පන්දනෙ නල්ලූර් මීනාච්චි සුන්දරම්පිල්ලෙ මහතා ය.

**37.** බහුලව 'ජාවලිවල' යෙදී ඇති බස වනුයේ,
(1) සංස්කෘත ය. (2) දෙමළ ය. (3) හින්දි ය.
(4) තෙළිඟු ය. (5) පාලි ය.

**38.** නිවසේදී භාවිත කරන භාණ්ඩ අතෙහි තබාගෙන නටන නර්තනය වනුයේ,
(1) බොම්මලාට්ටම් (රූකඩ) ය. (2) ජින්දල් නැටුම ය.
(3) කුදිරෛ ආට්ටම් (අශ්ව නැටුම) ය. (4) කුම්මි ය.
(5) කොලුන්දු නර්තනය ය.

**39.** 'මිශ්‍ර අලාරිප්පුවල' තීර්මාණම් කොටසෙහි සඳහන් ත ක තදිං කි ණ දොම්,; ත ක තදිං කිණ දොම්,; ත ක තදිං කිණ දොම්, යනුවෙන් පිහිටා ඇති යති වනුයේ,
(1) සම යති (2) විසම යති (3) ඩමරුක යති
(4) කෝපුච්ච යති (5) මිරුදංග යති

**40.** "තික්කිඩ - උදරක - ඩන් - කිණ්ණම් ..." යන ගීතයේ යෙදී ඇති කොටස අයත් වන ගෞත්තුවම් වනුයේ,
(1) සන්මුග ගෞත්තුවම් (2) විෂ්ණු ගෞත්තුවම්
(3) නඩේස ගෞත්තුවම් (4) ශක්ති ගෞත්තුවම්
(5) ගණපති ගෞත්තුවම්

**41.** 'තිල්ලානා' යන උරුප්පඩිවල අලංකාරය සඳහා එක්කරන ලද අඩවු වනුයේ,
(1) මකුඩ අඩවු ය. (2) තට්ටුමෙට්ටඩව ය. (3) මෙයියඩවු ය.
(4) සරුක්කල් අඩවු ය. (5) මණ්ඩියඩවු ය.

**42.** "තක ජේණු තකුන්දරි" යනුවෙන් අංක සංඛ්‍යාවට සමානව යෙදෙන තවත් යෙදුමක් වනුයේ,
(1) තකදිමි තකදිමි (2) තකිට තකිට (3) තකිට තකදිමි
(4) තකදිමි තකතකිට (5) තක තකිට

**43.** යාපන විශ්වවිද්‍යාලය මගින් ගෞරව දර්ශනපති උපාධියක් ලබා ගෞරව කරන ලද නැටුම් කලාකරුවා වූයේ,
(1) ම. කයිලායපිල්ලෙ මහතා ය. (2) වී. කේ. නල්ලෛයියා මහතා ය.
(3) ය. තොම්මෙක්කුට්ටි මහතා ය. (4) න. වීරමණි අයියර් මහතා ය.
(5) වෙ. රාසරත්තිනම් මහතා ය.

**44.** අතීතම්, අනාගතම්, සමම් යන කොටස්වලින් යුක්ත වන්නේ කුමක් ද?
(1) අංගම් (අංගය) (2) ක්රහම් (3) කාගපාදම්
(4) පුලුදම් (5) ගුරු

**45.** නාට්‍ය නාඩගමකදී මංගල සංගීතයෙහි හා ප්‍රකාශ වන ආලෝකයෙන් පෙන්වා දෙන දර්ශනය වන්නේ,
(1) ස්වාමි තිරු වීදි උලා වරුදල් ය. (2) සටන් දර්ශනය ය.
(3) ස්වාභාවික විපත් ය. (4) වෙල්යායක දර්ශනය ය.
(5) උද්‍යානයක් ය.

**46.** නායක්කාර් කාලයේදී මෙලට්ටූර් භාගවදමේලා ගීත නාටකයට සහභාගි වූවන් වන්නේ,
(1) දේවදාසීන් ය. (2) තලෙක්කෝලිකල් ය.
(3) අරසවෙ නාට්‍යාංගනාවෝ ය. (4) දිව්‍යලෝකයේ නාට්‍යාංගනාවෝ ය.
(5) අන්දනර්කල් ය.

**47.** නඩරාජ තිරුවුරුව දර්ශනයේදී පහළට තබා ඇති 'තිරුවඩි (පාද)' හඳුන්වා ඇත්තේ,
(1) කැමැති අකමැති නොමැති ස්වභාවයයි.
(2) මංගල ස්වරූපයයි.
(3) අහංකාරකම විනාශ කිරීමයි.
(4) විනාශ නොවන තත්ත්වයයි.
(5) නොදන්නාකම විනාශ කිරීමයි.

**48.** "කුයිලේ උණක්කනන්ද කෝඩි නමස්කාරම් කුමරන් වරක් කූ වුවායි......" නමැති සංදේශ පදම් නිර්මාණය කරනු ලැබුවේ,
(1) සුබ්‍රමනිය භාරදියාර් ය. (2) භාපනාසම් සිවන් ය. (3) කවිකුංජර භාරති ය.
(4) සුත්තානන්ද භාරති ය. (5) මුත්තුත් තාණ්ඩවර් ය.

**49.** තිර්මාණම් නිර්මාණය කිරීමේදී වඩාත් සුදුසු සොට්කට්ටු (වචන සමූහය) වනුයේ,
(1) තා තෙයි තෙයිත දිත් තෙයි තෙයිත (2) දීනුත තත්දිමි තාකත ජෙම්
(3) තකදිමි තකදිමි දිතිතෙයි (4) තකිට තකිට තකිට තකිට
(5) තෙයි හත් තෙයිකි තෙයියා තෙයියි

**50.** ස්වාමි විපුලානන්ද ලලිත කලා අධ්‍යයන ආයතනයේ ප්‍රධානියා ලෙස පත් කරන ලද අන්නාමලෙ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයා වූයේ
(1) රාසමානික්කම් පිල්ලෛ මහතා ය. (2) වජ්‍රවේලු මුදලියාර් මහතා ය.
(3) සුබ්‍රමනියම් පිල්ලෛ මහතා ය. (4) කෝමදි සංකර අයියර් මහතා ය.
(5) සිවානන්දම් පිල්ලෛ මහතා ය.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

**නැටුම් (භරත) II**
நாட்டியம் (பரதம்) II
Dancing (Baratha) II

**53 S II**

**2018.08.09 / 0830 - 1140**

**පැය තුනයි**
*மூன்று மணித்தியாலம்*
*Three hours*

| | |
|---|---|
| අමතර කියවීම් කාලය | - මිනිත්තු 10 යි |
| மேலதிக வாசிப்பு நேரம் | - 10 நிமிடங்கள் |
| Additional Reading Time | - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
✻ **I** කොටසේ **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **දෙකක්** ද **II** කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) ඔබ ඉගෙන ගත් 'පදවර්ණම්'හි, රාගය හා තාලය සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ii) ඔබ සඳහන් කළ 'පදවර්ණම්'හි පද රචනය කළ පුද්ගලයා, නැටුම නිර්මාණය කළ පුද්ගලයා, කතා නායකයා සහ කතා නායිකාව සඳහන් කරන්න. (ලකුණු 04යි.)

(iii) (අ) මෙම 'පදවර්ණම්'හි පල්ලවි කොටස අවසන් වූ පසු ආරම්භ වන තීර්මාණම්, තාලාංග සංකේත සමග ලියන්න. (ලකුණු 08යි.)

(ආ) මෙම 'පදවර්ණම්'හි මුත්තායිෂ්වර කෝර්වෙ එකක් තාලාංග සංකේත සමග ලියන්න. (ලකුණු 06යි.)

**2.** "දරුණ" යන නිරුත්ත උරුප්පඩි සහිත ශාස්ත්‍රීය නැටුම පහත සඳහන් කරුණු පදනම් කරගෙන පැහැදිලි කරන්න.

(i) ප්‍රභවය (ලකුණු 03යි.)

(ii) වර්ධනය (ලකුණු 03යි.)

(iii) සංගීතය හා සංගීත භාණ්ඩ (ලකුණු 02යි.)

(iv) නර්තන ආකාරය (ලකුණු 06යි.)

(v) ඇඳුම් පැළඳුම් හා අංගරචනය (ලකුණු 06යි.)

**3.** (i) (අ) 'නායගර්ගල් (වීරවරයන්)' වර්ග **හතර** සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ආ) ඔවුන්ගේ ලක්ෂණ උදාහරණ සමග පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

(ii) (අ) 'සිරුංගාර නායගර්ගල් (වීරවරයන්)' සඳහන් කරන්න. (ලකුණු 02යි.)

(ආ) ඔවුන්ගේ වර්ග සඳහන් කර පැහැදිලි කරන්න. (ලකුණු 08යි.)

## II කොටස

**4.** කෙටි සටහන් ලියන්න.

(i) ස්ථානක භේදම්

(ii) බොම්මලාට්ටම් (රූකඩ)

(iii) පර්වදයදි

(iv) විභාවම්

(v) ආරපඩි විරුත්ති

(ලකුණු 04 × 5 = 20යි.)

[ දෙවැනි පිටුව බලන්න.

**5.** කලා ශේත්‍රා ආයතනයේ පුරෝගාමියකු වන රුක්මනි අරුන්ඩේල් මහත්මියගේ **මුල් ගුරුතුමියගේ** ජීවිත කතාව හා භරත කලාවට ඇය කළ සේවය අගයන්න. (ලකුණු 20යි.)

**6.** "දේවස්ථාන විසින් නර්තන කලාව ආරක්ෂා කර වර්ධනය කරන ලදී." මෙම ප්‍රකාශය චෝල රාජ්‍ය සමය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 20යි.)

**7.** (i) අභිනය යනු කුමක් ද? (ලකුණු 02යි.)
(ii) සිව් ආකාර අභිනයන් සඳහන් කර, ඒවායේ ඇතුළත් කොටස් සඳහන් කරන්න. (ලකුණු 08යි.)
(iii) භරත නාට්ටියම් රංගනයක සිව් ආකාර අභිනයන්ගේ සහභාගිත්වය උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි.)

**8.** භරත නාට්‍ය රංගනයක ඇඳුම, අංගරචනය, පැළඳුම්, හඬ, ආලෝකය හා වේදිකා අලංකරණය යන ඒවායේ සහභාගීත්වය උසස් තත්ත්වයකට යන විට එම නැටුමෙන් ප්‍රකාශනය වන රංගනය සීමා කෙරේ." මෙම ප්‍රකාශයේ අදාළත්වය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න. (ලකුණු 20යි.)

* * *